## ප්‍රවාහන මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

## ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම

REDECO

# රැකියා අවස්ථා

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අනුබද්ධිත සමාගමක් වන ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගමේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### බර වාහන රියදුරු - (කොන්ත්‍රාත්)

| | | |
|---|---|---|
| **සුදුසුකම්** | : | අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිට තිබීම.<br>සහ<br>බර වාහන පැදවීම සඳහා වලංගු බලපත්‍රයක් ලබාගැනීමෙන් පසු පිළිගත් ආයතනයක බර වාහන පැදවීම පිළිබඳ අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම.<br>**සැ. යු.** ට්‍රැක්ටර් රථ පැදවීම සම්බන්ධව පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ඇත. |
| **වැටුප** | : | කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් ගෙවීම ක්‍රියාත්මක වනු ඇත.<br>(2026.01.01 දිනට මූලික වැටුප රු. 40,834/-<br>+ ජීවන වියදම් දීමනාව)<br>❖ වෙනත් ප්‍රතිලාභ<br>අනුමත අතිකාල දීමනා / වෛද්‍ය දීමනා / වාර්ෂික ප්‍රසාද දීමනා |
| **වයස් සීමාව** | : | අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. |

අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු අතර, තනතුරට අදාළ රාජකාරී කාර්යක්ෂමව හා ආරක්ෂිතව ඉටු කිරීමට අවශ්‍ය ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම ජීව දත්ත සහිත අයදුම්පත්, අධ්‍යාපන, වෘත්තීය සහ සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් හා තමා පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග 2026.10.23 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් සහ නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් තමන්ගේ ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතු අතර, අදාළ තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් එම තනතුරෙහි වැඩ භාරගැනීමට තම ආයතනයෙන් මුදා හැරිය හැකි බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

**සාමාන්‍යාධිකාරී,**
**ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම,**
**No. 28/10A, කිරිමණ්ඩල මාවත, නාවල, රාජගිරිය.**

**සභාපති,**
**ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම**
**අංක 28/10ඒ, කිරිමණ්ඩල මාවත, නාවල, රාජගිරිය.**